# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,207—1960 සැප්තැම්බර් 30 වැනි සිකුරාදා—30.9.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 907 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ... | 907 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 907 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 908 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 909 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 910 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


### අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1960 අංක 414**

අංකය : ඩී. 31/රෙක්ව්.

**ශුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

තාවකාලික කපිතාන්වරුන් වශයෙන්

ලෙප්ටිනන්ට් ඩී. යූ. වීරසිංහ, සී. ඒ. 1960 ජනවාරි මස 28 වැනි දින සිට.

ලෙප්ටිනන්ට් එස්. විජයරත්න, සී. ඒ. 1960 ජනවාරි මස 28 වැනි දින සිට.

ලෙප්ටිනන්ට් ඩී. එම්. එච්. බී. තම්මිත්තෙගම, සී. ඒ. 1960 ජූනි මස 15 වැනි දින සිට.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1960 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දීය.

9453

---

**1960 අංක 415**

අංකය : ඩී. 31/රෙක්ව්.

**ශුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

තාවකාලික කපිතාන් වශයෙන්

ලෙප්ටිනන්ට් එල්. පී. ජී. ප්‍රනාන්දු, සී. ඊ., 1960 ජූනි මස 15 වැනි දින සිට.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1960 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දීය.

9454

### රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1960 අංක 416**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත්කිරීම කරන ලෙස නියමකර ඇත්තේය :—

ඒ. 266/60.

1960 සැප්තැම්බර් මස 8 වැනි දින සිට බී. මහාදේව මහතා (සී. සී. ඇස්.) දිවයිනෙන් බැහැරව සිටින කාලය තුල හෝ නැවත නියමයක් කරන තුරු, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් පී. ඒ. සිල්වා මහතා (සී. සී. ඇස්.) ස්වකීය රාජකාරිවලට අතිරේකව රබර් පාලක, තේ පාලක හා පොල් වැවීම නගා සිටුවීමේ කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 සැප්තැම්බර් මස 24 වැනි දින,
තැ. පෙ. 500, කොළඹ 1,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

9574

---

### අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1960 අංක 417**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඑස්. 12/48.

ඩී. විමලරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1960 සැප්තැම්බර් 30 වැනි දින සිට, කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 33,882/ඒ (එන්එස්) නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1960 සැප්තැම්බර් 19 වැනි දින සිට 23 වැනි දින දක්වා, කොළඹ රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 70ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු පී. එන්. බතෝලමියුස් මහතා 1960 සැප්තැම්බර් 16 වැනි දින සිට 18 වැනි දින දක්වා, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උදලාගම මහතා 1960 සැප්තැම්බර් 17 වැනි දින සිට 19 වැනි දින දක්වා, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1960 සැප්තැම්බර් 22 වැනි දින, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේ.එල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සී. අනපත්තු මහතා 1960 සැප්තැම්බර් 21 වැනි දින සිට 26 වැනි දින දක්වා, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 13ඒ/59.

ටී. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. පී. ද සිල්වා මහතා 1960 සැප්තැම්බර් 22 වැනි දින සිට 27 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 46/48.

සී. එම්. එල්. ද සිල්වා මහතා 1960 සැප්තැම්බර් 19 වැනි දින, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/53.

ඒ. වෛත්‍යලිංගම් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1960 සැප්තැම්බර් 20 වැනි දින සිට, කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 70ඒ/57.

සී. බී. වල්ගම්පාය මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ජේ. එම්. ද සිල්වා මහතා 1960 සැප්තැම්බර් 19 වැනි දින සිට, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 67/48.

එස්. තම්බිදුරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා 1960 සැප්තැම්බර් 19 වැනි දින සිට 21 වැනි දින දක්වා, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පීඑල්/එන්. 1/50.

වී. නල්ලසේගරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. ආර්. රජේන්ද්‍රා මහතා 1960 සැප්තැම්බර් 27 වැනි දින සිට 1960 ඔක්තෝබර් 1 වැනි දින හා 3 වැනි දිනද, යාපන දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා උතුරු වලිකාමම්, වඩමරඩචි හා යාපනේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු එස්. එච්. සිරිවර්ධන මහතා 1960 සැප්තැම්බර් 27 වැනි දින සිට 29 වැනි දින දක්වා, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ පහත බුලත්ගම, ඇතුළුගම් හා පනාවල් කෝරලයන්හි ගම්බද උසාවියේ සභාපති ධුරයේ හා බෙලිගල් හා කුරුවිටි කෝරලයන්හි ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. 33/57.

වී. ආර්. සත්චිත්තානන්දන් මහතා 1960 ඔක්තෝබර් 12 වැනි දින කුච්චවෙලි ගම්බද උසාවියේ අංක සීආර්එම්. 434 නඩුව ඇසීමට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තු ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. 23/57.

පී. ආර්. රාජේන්ද්‍රා මහතා 1960 ඔක්තෝබර් 13 වැනි දින, පුලොලි ගම්බද උසාවියේ අංක සීආර්එම්. 4,731 නඩුව ඇසීමට, යාපන දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා උතුරු වලිකාමම්, වඩමරඩචි හා යාපනේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 සැප්තැම්බර් 20 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායර්‍යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

9515

## වෙනත් පත් කිරීම්

1960 අංක 418

අංකය : ඕඇම්. 4/1/11 ඇෆ්ජ් ii

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරු කිරීම් පහත දනුම් දී ඇති දිනයන්හි සිට බල පැවැත්වේ:—

1960 අගෝස්තු මස 8 වැනි දින සිට නැවත නියම කරන තුරු, ලංකා විදේශ සේවයේ සිව් වැනි පෙළේ ඩී. ජී. බී. ද සිල්වා මහතා, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ උප ලේකම් වශයෙන්.

1960 අගෝස්තු මස 16 වැනි දින සිට නැවත නියම කරන තුරු, ලංකා විදේශ සේවයේ සිව් වැනි පෙළේ අයි. ඇම්. කන්නන්ගර මෙනෙවිය, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ උප ලේකම් වශයෙන්.

1960 අගෝස්තු මස 21 වැනි දින සිට නැවත නියම කරන තුරු, ලංකා විදේශ සේවයේ සිව් වැනි පෙළේ වයි. යෝගසුන්දරම් මහතා, චීනයේ ලංකා තානාපති කායර්‍යාලයේ පළවැනි ලේකම් වශයෙන්.

ඇම්. ඇෆ්ජ්. ද ඇස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථාවර ලේකම්.

1960 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ 1, උත්තර මන්ත්‍රී මණ්ඩල ගොඩනැගිල්ලේදීය.

9534

1960 අංක 419

අංකය : ඒ. ජේ. 16/1/57.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

එච්. පී. වෙහෙරගොඩ මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් පත්කර ඇත්තේ ය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථාවර ලේකම්.

1960 සැප්තැම්බර් මස 27 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

9474 ඒ

### 1960 අංක 420

1951 කේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනතේ 14 වෙනි වගන්තිය යටතේ කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් දකුණු කොළඹ ක්වාසි විනිශ්චය මණ්ඩලයේ අංක 626 දරණ නඩුව විභාග කොට තීරණය කරනු වස් රත්නපුර අධිකරණ කොට්ඨාශයේ ක්වාසිවර ඒ. ඇල්. ඇම්. ජිනෙසිදීන් මහතා විශේෂ ක්වාසි හැටියට දකුණු කොළඹ අධිකරණ කොට්ඨාශයට පත් කරන්ට යෙදුනා ඇත.

ඇල්. ඇස්. බී. පෙරේරා,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1960 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ.

9528

---

### 1960 අංක 421

1951කේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනතේ 12 (1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර ඇමතිතුමා විසින් 1960.10.1 සිට 1960.12.31 දින දක්වා මහනුවර උඩබුලත්ගම කොට්ඨාශයේ හා නුවරඑලිය දිස්ත්‍රික්කයේ හපුගස්තලාව යන ග්‍රාමයේ ක්වාසි තනතුරට නාවලපිටියේ පැනි තුඩුමුල්ලේ පදිංචි මීරා ලෙබ්බෙ මොහමඩ් හෂීම් මහතා පත් කරන්ට යෙදුනා ඇත.

ඇල්. ඇස්. බී. පෙරේරා,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1960 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 7.

9501

---

## ආණ්ඩුවේ නිවේදන

### පඩි පාලක සභා ආඥාපනත

වර්ෂ 1960 ජූලි මස 20 වන දින සිට අවුරුදු 3 ක කාලයක් තුළ පුරුවටු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් හැටියට පෙනී සිටීමට වර්ෂ 1941 අංක 27 දරණ පඩි පාලක සභා ආඥා පනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමති තුමන් විසින් මෙහි පහත නම් සඳහන් අය පත් කරණ ලද බව 1943 පඩි පාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරණු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
අතිරේක සථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍යාංශය.

1960 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දීය.

**නම නියම කොට පත්කරණ ලද සාමාජිකයෝ :**

ආර්. සී. ඇස්. කුක් මහතා
කේ. කනගරත්නම් මහතා
ආර්. බුවනේන්ද්‍රම් මහතා

**සේව්‍ය නියෝජිතවරු :**

වී. කේ. රාජලිංගම් මහතා
වී. ඇස්. ඇන්. ත්‍යාගරාජා මහතා
කේ. ඇම්. ඇස්. ඇඩ්වින් ජෝසප් මහතා
පී. තම්බි මහතා

**සේවක නියෝජිතවරු :**

ඒ. වෛද්‍යලිංගම් මහතා
ඇස්. ආරුමුගම් මහතා
ඒ. තුරෙයි රාජසිංහම් මහතා
ඇස්. මුත්තයියා මහතා

9539

---

### පඩි පාලක සභා ආඥාපනත

තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු වූ එච්. බෘම් මහතා දිවයිනෙන් බැහැර සිටින කාලය තුල ඔහු වෙනුවෙන් එම පඩි පාලක සභාවේ සාමාජික යෙකු ලෙස පෙනී සිටීමට වර්ෂ 1943 අංක 40 දරණ (සංශෝධන) ආඥාපනතින් හා 1953 අංක 5 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත වර්ෂ 1941 අංක 27 දරණ පඩි පාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමතිතුමන් විසින් ජේ. ඇම්. කර්ස්විල් මහතා පත් කරන ලද බව වර්ෂ 1943 කම්කරු පඩි සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
අතිරේක සථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍යාංශය.

1960 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දීය.

9540

---

### පඩි පාලක සභා ආඥාපනත

වර්ෂ 1960 මාර්තු 11 වන දින සිට අවුරුදු 3 ක කාලයක් තුළ බේකරි කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකයන් හැටියට පෙනී සිටීමට වර්ෂ 1941 අංක 27 දරණ පඩි පාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමතිතුමන් විසින් මෙහි පහත නම් සඳහන් අය පත්කරණ ලද බව 1943 පඩි පාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
අතිරේක සථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍යාංශය.

1960 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දීය.

**නම නියම කොට පත් කරණ ලද සාමාජිකයෝ :**

ඇන්. ඇස්. සී. පෙරේරා මහත්මිය
ඇස්. බී. යටවර මහතා
ඇස්. ඒ. විජයතිලක මහතා

**සේව්‍ය නියෝජිතවරු :**

ඩී. ඇස්. ඉලයපෙරුම මහතා
ඒ. ජී. හින්නිඅප්පුහාමි මහතා
ඇම්. ඒ. පියතිස්ස මහතා
මුදලිඳු ඇන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ
ඇස්. විතාරණ මහතා
ජේ. ඊ. ටී. ක්‍රිස්ටෝපර් මහතා
රිචර්ඩ් පෙරේරා මහතා
ඩබ්ලිව්. ඇස්. එච්. සොයිසා මහතා
ඇම්. එච්. ආර්. ඇස්බරි මහතා

**සේවක නියෝජිතවරු :**

කේ. කුලවීරසිංහම් මහතා
පී. ඇල්. ඩී. සියදෝරිස් මහතා
ජේ. ඇම්. පූජිත ගුණවර්ධන මහතා
ඩී. බී. ලියනගේ මහතා
බර්ටි ජයසිංහ මහතා
ඇම්. ජී. පිලිප්ස් මහතා
ඇස්. ඩී. ඔස්ටින් ගුණවර්ධන මහතා
ජී. පී. පෙරේරා මහතා

9541

## 1956 අංක 30 දරන ධීවර (සංශෝධන) පනතෙන් සංශෝධනය කරන ලද 1952 අංක 25 දරන ධීවර (සංශෝධන) පනතේ 18 ඒ (3) වගන්තිය යටතේ කරන ලද නිවේදනයයි

1956යේ අංක 30 හා 1952කේ අංක 25 දරන ධීවර (සංශෝධන) පනත් වලින් සංශෝධිත, 1940යේ අංක 24 දරන ධීවර ආඥා පනතේ 18 ඒ (1) වගන්තිය ප්‍රකාර ගරු කර්මාන්ත හා ධීවර ඇමති ජේ. ඩී. වීරසේකර මහතා විසින් පුත්තලම දිස්ත්‍රික්කයේ තලවිල සහ පාල කුඩාහි සථිර ලෙස පදිංචි මස් මරන්නන්ගෙන් සමන්විත එක පක්ෂයක් හා මීගමුව, මට්ටකොටුව, හලාවත, වෙන්නප්පුව, උල්හිටියාව, තලයෝන, දූව, කුඩාපාඩුව, තොඩුවාව, වෙලිගම්පිටිය, කටුනේරිය, නයිනමඩම, කම්මල්තුරෙයි, පෝරුතොට, කොලින්ජාඩි, මාරාවිල, වාද්දුව, කම්මල, මුදුකටුව ආදී ප්‍රදේශයන්ගෙන් සංක්‍රමණය වන (කලින් කලට පැමිණෙන) මස් මරන්නන්ගෙන් සමන්විත අනික් පක්ෂයන් යන දෙපක්ෂය අතර, දකුණින් ඉරුම්බුකුඩල් පාඩුවේ දක්ෂිණ කෙළවරේ සිට උතුරින් තාලයඩි පාඩුවේ දක්ෂිණ කෙළවර තෙක් විහිදී ඇති ලංකාණ්ඩුව සතු යාබද මුහුදෙහි, ඔවුනොවුන්ගේ මස් මැරීමේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැන නැගී ඇති ආරාවුලක් ගැන ප්‍රසිද්ධ විභාගයක් පැවැත්වීමට හා රපෝර්තු කිරීමට මට පවරා තිබේ.

2. ආරාවුලට අඩංගු කරුණු මෙසේය :—

තලවිල සහ පාලකුඩාහි සථිර ලෙස පදිංචි මස්මරන්නෝ මීගමුව, මට්ටකොටුව, හලාවත, වෙන්නප්පුව, උල්හිටියාව, තලයෝන, දූව, කුඩාපාඩුව, තොඩුවාව, වෙලිගම්පිටිය, කටුනේරිය, නයිනමඩම, කම්මල්තුරෙයි, පෝරුතොට, කොලින්ජාඩි, මාරාවිල, වාද්දුව, කම්මල, මුදුකටුව ආදී ප්‍රදේශයන්ගෙන් එන්නට එන්නටම වැඩිවෙන මසුන් මරන්නන් තලවිලට සංක්‍රමණයවී, දකුණින් ඉරුම්බුකුඩල් පාඩුවේ දක්ෂිණ කෙළවරේ සිට උතුරින් තාලයඩි දක්ෂිණ කෙළවර තෙක් විහිදී ඇති යාබද මුහුදෙහි මස් මරන බව පැමිණිලි කරති. ඔවුන්ගේ ජීවනෝපායට මින් බාධා සිදුවන නිසා, ඉහතින් සඳහන් මුහුදෙහි මේ සංක්‍රමණ මස් මරන්නන් මාලු ඇල්ලීම ගැන ඔව්හු විරුද්ධත්වය දක්වති.

3. දැනට ඉදිරිපත් කර තිබෙන කරුණු වලට ආරාවුල සම්බන්ධ සියලුම තොරතුරු ඇතුළත් වී නොමැතිව තිබිය හැකි බැවින්, ඉහතින් සංක්ෂෙපයෙන් සඳහන් කර තිබෙන ආරාවුලට ආගන්තුකවූ හෝ සම්බන්ධවූ හෝ සැම කාරණයක්ම විමසා බැලීමටත් එවැනි සැම කාරණයක් ගැනම රපෝර්තු කිරීමටත් මට පවරා තිබේ.

4. මේ ආරාවුලට සහභාගිවී ඇති හෝ ආරාවුල ගැන උනන්දුවක් දක්වන හෝ යමෙක් ආරාවුල සම්බන්ධව කරුණු ලියැවිලි මගින් ඉදිරිපත් කිරීමට සතුටුනම්, 1960 ඔක්තෝබර් 31 වැනි දාට හෝ ඊට පෙර කොළඹ, ගාලුමුවදොර, ධීවර අධිකාරී මහතාගේ කාර්යාලයට ලැබෙන පරිදි ඒවා එවිය යුතුයි.

5. මේ ආරාවුල සම්බන්ධ ප්‍රසිද්ධ විභාගයක් 1960 නොවැම්බර් 18 වැනිදා පෙරවරු 10ට කල්පිටිය තානායමේදී මා විසින් ආරම්භ කරනු ලැබේ. දිවුරුම් ගැනීමෙන් පසු, කට වචනයෙන් හෝ ලියැවිලි මගින් හෝ විභාගයේදී ඉදිරිපත් කරන සාක්ෂි මා විසින් අසනු ලැබේ. කලින් ඉදිරිපත් කර ඇති කරුණු ඔප්පු කිරීම සඳහා සාක්ෂිදීමට බලය ඇති සියලු දෙනාටම ඔවුන් විසින්ම හෝ කිසියම් මිත්‍රයකු මගින් හෝ නීතිඥයකු මගින් හෝ මෙදින සාක්ෂි ඉදිරිපත් කළ හැක.

රෝලන්ඩ් ද සොයිසා.

1960 සැප්තැම්බර් 21 වැනි දින,
කොළඹදීය.

9561

---

### ශුද්ධියක්

වර්ෂ 1960වෙ අගෝස්තු මස 12 වැනි දින අංක 12,182 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ I වැනි ඡේදයේ 823 පිටුවේ පළවූ 1960 අංක 338 දරණ නිවේදනයේ 25 වෙනි පේලියේ "පුත්තලම හා හලාවත පරිපාලන දිස්ත්‍රික්ක" යන්න "පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය" කියා සංශෝධනය විය යුතුයි.

9597

---

### ශුධියක්

#### 1946යේ අංක 37 දරණ කිරුම් හා මිණුම් පිළිබඳ ආඥාපනත

1960.9.16 දින අංක 12,201 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවේ I වැනි කොටසේ (I) වැනි ඡේදයේ 883 වෙනි පිටුවෙහි ඉහත සඳහන් ශීර්ෂය යටතේ පලවන නිවේදනයට අයත් උපලේඛනයේ 8 වැනි පේලියේ දක්වෙන "දින මැනීමේ ලී උපකරණ" යන්න "දිග මැනීමේ ලී උපකරණ" කියා නිවැරදි වියයුතුය.

9602

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

බම්බලපිටියේ, විශාඛා පාරේ පිහිටි ආණ්ඩුවේ නූල් ගබඩාව වාර්ෂික බඩු ගණන් බැලීම පිණිස 1960 සැප්තැම්බර් මස 22 වන දින පටන් 1960 ඔක්තෝබර් මස 10 වන දින දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ වසා තබ[illegible]යදෙන බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එස්. පෙරේරා,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂක තැන.

9464

---

### ප්‍රකාශනයයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ කන්ඔය සහ කැන්දෙගෙදර යන පළාත් වල ගවයන් අතර "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශොධිත) ආඥාපණතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : ඇඳුරුඔය සහ වන්නි හත්පත්තු.

දකුණට : දඹදෙනි හත්පත්තු.

නැගෙනහිරට : මදුරුඔය සහ වැළඹ වැල්ලි හත්පත්තු.

බස්නාහිරට : කටුගම්පොළ හත්පත්තු.

2. මෙම ආඥාපණතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙනයැම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරනලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මහව පශු වෛද්‍ය තැනගෙන් හෝ දේවමැදි හත්පත්තු කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1960ක්වූ සැප්තැම්බර් මස 23 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේදීය.

9533

---

## විශෙෂ නිවේදනයයි

1960 ඔක්තෝබර් 19 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1960 ඔක්තෝබර් 21 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 ඔක්තෝබර් 15 වැනි සෙනසුරාදා පස්වරු 12.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 සැප්තැම්බර් 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.